## 2017 ජනවාරි මස 24 වැනි අඟහරුවාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

682/'16

1\.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රාජ්‍ය හා පෞද්ගලික බැංකුවල ආරක්ෂක සේප්පු සේවාව සඳහා අයකරනු ලබන ගාස්තු ඉහළ දමා ඇති බවත්;

(ii) එයින් පාරිභෝගිකයන් අපහසුතාවයට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ආරක්ෂක සේප්පු සඳහා අයකරන ගාස්තු ඉහළ දැමීමට හේතු කවරේද;

(ii) පාරිභෝගිකයන්ට අමතර වරප්‍රසාද ලබා දෙන්නේද;

(iii) එසේ නම්, එම වරප්‍රසාද කවරේද;

(iv) මෙම සේවාවේ ගාස්තු පහත දැමීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

955/'16

2\.

ගරු බිමල් රත්නායක මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොරටුව විශ්ව විද්‍යාලයේ දැනට ක්‍රියාත්මක පීඨ සංඛ්‍යාව කොපමණද;

(ii) එහි ක්‍රියාත්මක දෙපාර්තමේන්තු සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් පීඨවල හා දෙපාර්තමේන්තුවල සිටිය යුතු ස්ථිර ආචාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ස්ථිර ආචාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තිබේද;

(v) එසේ නම්, පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් පීඨය සහ දෙපාර්තමේන්තුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

977/'16

3\.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) තාක්ෂණවේදය විෂය ධාරාවෙන් උසස් පෙළ අධ්‍යාපනය ලබා විශ්වවිද්‍යාලවලට ඇතුළත්වන සිසුන් සඳහා මේ වනවිට හඳුන්වාදී ඇති උපාධි පාඨමාලා කවරේද;

(ii) විශ්වවිද්‍යාලවල විවෘත කර ඇති තාක්ෂණවේද පීඨ සංඛ්‍යාව කොපමණද; ඒවා කවරේද;

(iii) රජයේ කාර්මික විද්‍යාලවල දැනට ක්‍රියාත්මකවන තාක්ෂණවේදයට අදාළ උසස් ඩිප්ලෝමා සහතිකය සහ ඉහත විශ්වවිද්‍යාලවල තාක්ෂණවේද පීඨ මඟින් ලබාදෙන උපාධි සහතිකය අතර වෙනස කවරේද;

(iv) තාක්ෂණවේදී උපාධිය මූලික සුදුසුකම ලෙස කවර මට්ටමේ රැකියා සඳහා සලකනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විශ්වවිද්‍යාල මඟින් දැනට මෙම තාක්ෂණවේදී උපාධිධාරීන් සඳහා උසස් ප්‍රමිතියක් සහිත විශේෂ පාඨමාලා සකස්කර තිබේද;

(ii) එසේ නම්, එම පාඨමාලා කවරේද;

(iii) තාක්ෂණවේදී උපාධිධාරීන්ගේ අනාගතය සුරක්ෂිත කිරීම සඳහා රජය දැනට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

983/'16

4\.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ පැවති කාලගුණ විපර්යාස පිළිබඳ පැරිස් සමුළුවේදී ගනු ලැබූ තීරණ කවරේද;

(ii) එකී තීරණ පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ එකඟත්වය පළකර තිබේද;

(iii) එසේ නම්, එම තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

994/'16

5\.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 සැප්තැම්බර් 24 දින යුද හමුදා රෝහලට ආධාර පිණිස "වායු" නමින් සංගීත සංදර්ශනයක් පැවැත්වීමට කටයුතු කර තිබූ බවත්;

(ii) එකී සංදර්ශනය සඳහා යුද හමුදා රෝහලේ සේවය කරන මේජර් සහ ඉන් ඉහළ නිල දරන නිලධාරීන්ට රු. 7,500/- ප්‍රවේශපත්‍ර දෙකක් ද, සෙසු නිල දරන නිලධාරීන්ට රු. 7,500/- එක් ප්‍රවේශපත්‍රයක් ද මිලදී ගැනීම අනිවාර්ය කර තිබූ බවත්;

(iii) එවැනි ඉහළ මුදලක් ගෙවීමට නොහැකි වීමෙන් නිලධාරීන් අසීරුතාවයට පත් වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ බලහත්කාරයෙන් ලබා ගත් මුදල් නැවත නිලධාරීන්ට ගෙවීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1003/’16

6\.
ගරු වාසුදේව නානායක්කාර මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කය තුළ පෞද්ගලික විදුලි බලාගාර ඉදිකිරීම සඳහා අනුමතිය ලබාගැනීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත මේ වනවිට ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව, ප්‍රභවය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) දැනට ක්‍රියාත්මක බලාගාර සංඛ්‍යාව කොපමණද;

(iii) බලපත්‍ර ලබාගෙන ක්‍රියාත්මක නොවන යෝජනා ක්‍රම කවරේද;

(iv) ඉහත (iii) සඳහා හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් නිතිපතා පාරිසරික පසු විපරම් සිදු කරන්නේද;

(ii) නොඑසේ නම්, පාරිසරික පසු විපරම් සිදු කරන වාරයන් කවරේද;

(iii) යෝජිත “ඉහළ කදුරුගල් දොළ” කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය සඳහා ලබා දී ඇති මූලික පරිසර අධ්‍යයන ඇගයීම් වාර්තාවේ පිටපතක් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1010/’16

7\.
ගරු නාමල් රාජපක්ෂ මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හම්බන්තොට දක්වා ඉදිකිරීමට යෝජිත අධිවේගී මාර්ගයේ ඉඩම් අත් කරගැනීම් අවසන්කර තිබේද;

(ii) එම ඉඩම් සඳහා වන්දි තක්සේරුකර තිබේද;

(iii) එසේ නම්, වන්දි මුදල් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i)හි සඳහන් ඉඩම් අයිතිකරුවන් වශයෙන් හඳුන්වනු ලබන, අනවසර පදිංචිකරුවන්, බලපත්‍රලාභීන් සහ සින්නක්කර ඔප්පුහිමියන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරි වසම් අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (ii)හි සඳහන් පුද්ගලයන් අතරින් මේ වනවිට වන්දි මුදල් ගෙවා ඇති සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) ඉහත (ii)හි සඳහන් පුද්ගලයන් අතරින් මේ වනවිට වන්දි මුදල් ගෙවා නොමැති සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(v) ඉහත (iv)හි සඳහන් පුද්ගලයන්ට වන්දි මුදල් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉවත් කරනු ලබන අනවසර පදිංචිකරුවන්ට ඉඩම් කොටසක් ලබා දෙන්නේද;

(ii) ඔවුන්ට නිවසක් ඉදිකර ගැනීමට සරිලන වන්දි මුදලක් ලබා දෙන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1023/'16

8.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට ප්‍රබල සමාජ ව්‍යසනයක් වී ඇති වකුගඩු රෝගයෙන් පීඩා විඳින රෝගීන් වෙනුවෙන් ක්‍රියාත්මක වන වකුගඩු රෝගී ආධාර වැඩසටහන ගම්පහ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා මෙම වර්ෂයට වෙන්කර ඇති මුදල කොපමණද;

(iii) මේ වනවිට වන්දි ප්‍රදානය කර ඇති රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉදිරියේදී වන්දි ගෙවීමට සැලසුම් කර ඇති රෝගීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i) හි සඳහන් වැඩසටහන ගම්පහ දිස්ත්‍රික්කය තුළ මේ වනවිට ක්‍රියාත්මක නොවේ නම්, ඉදිරියේදී එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

(iii) මෙම වැඩසටහන පිළිබඳව එම ප්‍රදේශවල සාමාන්‍ය ජනතාව දැනුවත් වී නොමැති බැවින්, සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් පුළුල් ප්‍රචාරයක් ලබා දී අදාළ ජනතාව තවදුරටත් දැනුවත් කිරීමට ක්‍රියාමාර්ගයක් ගන්නේද;

(iv) එසේ නම්, ඒ කවර ආකාරයකින්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1025/'16

9.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය,— තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මුලතිව්, වව්නියා සහ මන්නාරම දිස්ත්‍රික්කවල පශු සම්පත් සඳහා වූ තෘණ බිම් සඳහා වෙන් කර ඇති ඉඩම් ප්‍රමාණය, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මුලතිව් ප්‍රදේශයේ පශු සම්පත් සඳහා වූ තෘණ බිම් ලෙස ප්‍රකාශයට පත්කොට ඇති ඉඩම් මුදා ගැනීමට වනජීවී ආරක්ෂක අංශය විසින් අවසර දීම ප්‍රතික්ෂේප කරමින් සිටින බව දන්නේද;

(iii) පශු පාලනයේ නිරතවන්නන් මුහුණ දෙන ප්‍රශ්නවලට විසඳුම් ලබාදීමක් වශයෙන් තෘණ බිම් ලෙස වෙන්කර තිබෙන ඉඩම්, වනජීවී ආරක්ෂක අංශයෙන් මුදවාගෙන පශු පාලනයේ නිරතවන්නන්ගේ ප්‍රයෝජනය සඳහා ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

(iii) සුනේත්‍රාදේවී පාරේ පදිංචි සිවිල් ඉංජිනේරු තිස්ස ද සිල්වා නමැති අය මේ පිළිබඳව මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් නිහාල් රූපසිංහ මහතා දැනුවත් කර ඇතත්, ප්‍රතිඵලයක් නොවූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ සම්බන්ධයෙන් ගැනීමට අපේක්ෂිත පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1031/'16

8\.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යුදමය තත්ත්වය හේතුවෙන්, රාජකාරියේ යෙදී සිටියදී මියගිය/ආබාධිත වූ නිලධාරින්ට වන්දි ගෙවීම සඳහා අංක 59/89 සහ 21/88 දරන චක්‍රලේඛ නිකුත් කළ බවත්;

(ii) ඉන් අනතුරුව, 2005.05.04 දිනැති අංක 22/93 (III) දරන චක්‍රලේඛය මඟින් අවසන් වරට ලැබූ වැටුප පදනම් කරගෙන මාස 120ක වැටුප වන්දියක් ලෙස ගෙවීමට කටයුතු යෙදූ බවත්;

(iii) එසේ වුවද, මෙම චක්‍රලේඛයන්හි විධිවිධාන, අංක 21/88 සහ 59/89 දරන චක්‍රලේඛ යටතේ (REPPIA) සහන ලැබූවන්ට අදාළ නොවීම හේතුවෙන් පීඩාවට පත්වූ පවුල් විශාල ප්‍රමාණයකට සැළකිය යුතු සහන හිමි නොවූ බවත්;

(iv) මේ වනවිට සහන ඉල්ලා සිටීමේදී ආරක්ෂක අංශවල ආරක්ෂක නිශ්කාෂණ වාර්තා ඉදිරිපත් කළ යුතු බවට කොන්දේසි ඉදිරිපත් කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත කාරණය සම්බන්ධයෙන් අංක 21/28, 59/89, 22/93 හා 22/93 (III) දරන චක්‍රලේඛ හා බැඳුනු නව චක්‍රලේඛයක් නිකුත් කිරීමටත්;

(ii) නිලධාරියාට වයස අවුරුදු 55 සම්පූර්ණ වනතුරු මියගිය අයගේ පවුල්වලට වැටුප සහ වන්දි මුදලක් ගෙවීමටත්;

(iii) ආරක්ෂක අංශවලින් ලබාගත යුතු ආරක්ෂක නිශ්කාෂණ වාර්තාවලින් නිදහස් කිරීමටත්;

පියවර ගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1032/'16

9\.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උතුරු හා නැගෙනහිර පැවති යුද ගැටුම් හේතුවෙන් අවතැන් වූ මුළු පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2009 පසුව, 2015 ජනවාරි දක්වා කාලය තුළ නැවත පදිංචි කරන ලද පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (ii)හි සඳහන් සංඛ්‍යාව, මුළු අවතැන් පවුල් සංඛ්‍යාවෙන් කවර ප්‍රතිශතයක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2016 ජනවාරි වනවිට සුභසාධන කඳවුරු තුළ සිටි පවුල් සංඛ්‍යාව හා පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2016 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ නැවත පදිංචි කර ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) නැවත පදිංචි කිරීමට ඉතිරිව සිටින පවුල් සංඛ්‍යාව හා පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) නැවත පදිංචි නොකර තවදුරටත් කඳවුරුවල ජනතාව රඳවා තැබීමට හේතු කවරේද;

(v) නැවත පදිංචි කිරීමේ කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කරන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1073/'16

10.

ගරු කනක හේරත් මහතා,— තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පින්නවල අලි අනාථාගාරයෙහි දැනට සිටින අලි ඇතුන් සංඛ්‍යාව කොපමණද;

(ii) පින්නවල අලි අනාථාගාරය හැරුණු විට වෙනත් අලි අනාථාගාරයක් අලුතින් පිහිටුවීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, ඒ කවර ප්‍රදේශයකද;

(iv) ඒ සඳහා අලි ඇතුන් පින්නවල අලි අනාථාගාරයෙන් ලබා ගන්නේද;

(v) එසේ නම්, ඒ කොපමණ සංඛ්‍යාවක්ද;

(vi) මේ නිසා පින්නවල අලි අනාථාගාරයට පවතින ජනප්‍රියතාවට, දියුණුවට හා පැවැත්මට හානියක් සිදු විය හැකි බව පිළිගන්නේද;

(vii) එසේ නම්, එම හානිය වැළැක්වීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1098/'16

11.

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාත්තණ්ඩිය සිට මාරවිල හරහා කොළඹ දක්වා කිසිදු ලංගම බස්රථ සේවයක් ක්‍රියාත්මක නොවන බවත්;

(ii) නාත්තණ්ඩිය සිට මාරවිල දක්වා වූ මාර්ගයේ ජීවත්වන විශාල පිරිසක්, දිනපතා වෙන්නප්පුව, මීගමුව, කටුනායක, ජා ඇල හා කොළඹ ආදී නගරවල රැකියා සඳහා ගමන් කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) නාත්තණ්ඩිය මාරවිල හරහා කොළඹ දක්වා උදෑසන ලංගම බස් රථයක්ද, සවසට කොළඹ, මාරවිල හරහා නාත්තණ්ඩිය දක්වා ලංගම බස්රථයක්ද ධාවනය කරවීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

698/'16

12.

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂය තුළ ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද කොත්තමල්ලි ප්‍රමාණය කොපමණද;

535/'16

2\.

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 වනවිට ශ්‍රී ලංකාවේ සෝයා බෝංචි වගා කරනු ලැබූ භූමි ප්‍රමාණය කොපමණද;

(ii) 2010 සිට 2015 දක්වා කාලය තුළ සෝයා බෝංචි නිෂ්පාදනය, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කිලෝග්‍රෑම් කොපමණද;

(iii) රජය විසින් ගොවීන්ගෙන් සෘජුවම සෝයා බෝංචි මිලදී ගන්නේද;

(iv) එසේ නම්, පසුගිය වසර පහ තුළ රජය විසින් මිලදී ගත් සෝයා බෝංචි ප්‍රමාණය, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සෝයා බෝංචි නිෂ්පාදනය ඉහළ නැංවීමට රජය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

675/'16

3\.

ගරු බිමල් රත්නායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කිලිනොච්චිය, මුලතිව්, යාපනය, පුත්තලම, අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය, වවුනියාව සහ මන්නාරම යන දිස්ත්‍රික්ක තුළ දැනට හඳුනාගෙන ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත (i) හි සඳහන් ස්ථාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් ස්ථාන අතරින් මේ වනවිට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සංරක්ෂණය කර ඇති ස්ථාන සංඛ්‍යාව කොපමණද; එම ස්ථාන කවරේද;

(iv) සංරක්ෂණ කටයුතු තවමත් අරඹා නොමැති දැඩි තර්ජනයකට මුහුණ දී ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් ස්ථාන කවරේද;

(v) ඉහත (iv) හි සඳහන් ස්ථාන සංරක්ෂණය සඳහා රජයේ ආයතන විසින් සකස් කර ඇති වැඩසටහන් කවරේද;

(vi) ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

873/'16

4\.

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ඌව පළාත් වත්මන් ප්‍රධාන අමාත්‍යවරයා විසින් ඌව පළාතේ පාසල් ශිෂ්‍යයන්ට පාසල් බෑග් ලබාදීමේ වැඩසටහනක් ආරම්භ කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, බදුල්ල දිස්ත්‍රික්කයේ මේ දක්වා එම ප්‍රතිලාභ ලැබී ඇති ශිෂ්‍යයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා දැනට දරා ඇති මුළු වියදම කවරේද;

(iv) එම මුදල් ලබාගත් මූලාශ්‍ර කවරේද;

(v) මෙහිදී යම් අක්‍රමිකතාවක් සිදු වී තිබේද;

(vi) එසේ නම්, ඒ සඳහා ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

910/'16

5.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යුද්ධයෙන් අවතැන්වූවන් රැඳී සිටින වවුනියාව, පූංතොට්ටම් කඳවුර විවෘත කරන ලද දිනය කවරේද;

(ii) එම කඳවුර තවමත් පවත්වාගෙන යන්නේද;

(iii) එසේ නම්, දැනට එම කඳවුරේ පදිංචිකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එයට වැසිකිළි, ජල සහ විදුලිය පහසුකම් ලබා දී තිබේද;

(v) එම අවතැන්වූවන් වෙනත් ස්ථානයක ස්ථිර වශයෙන් පදිංචි කිරීමේ යෝජනාවක් ඉදිරිපත්ව තිබේද;

(vi) එසේ නම්, එය කවරේද;

(vii) වසර ගණනාවක් වවුනියාවේ ජන ජීවිතයට හුරුවී සිටින එම ජනතාව සිංහල - දෙමළ සංහිඳියාව සුරකිමින් එම ප්‍රදේශයේ ජීවත්වන බැවින්, ඔවුන්ට එම ස්ථානයේම නිවාස සංකීර්ණයක් ඉදිකර පදිංචි කරවීමට ඇති නොහැකියාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

938/'16

6.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉන්දු - ශ්‍රී ලංකා සමුද්‍ර විදුලි රැහැන් මාර්ග ව්‍යාපෘතිය මඟින් ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු කවරේද;

(ii) එම ව්‍යාපෘතිය 2020 වසරේදී අවසන් කිරීමට හැකියාව තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම ව්‍යාපෘතිය සඳහා,

(i) ඇස්තමේන්තුගත සම්පූර්ණ මුදල කොපමණද;

(ii) ශ්‍රී ලංකා රජය විසින් දරනු ලබන වියදම කවරේද;

(iii) ඉන්දීය රජය විසින් මුදල් ආයෝජනයක් කරන්නේ නම්, එම මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

